# විෂය නිර්දේශය

(පළමුවන ප්‍රධාන අවධිය සඳහා)

# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## දෙවන ශ්‍රේණිය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ප්‍රාථමික අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකා

2007

# විෂය නිර්දේශය
## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් (සිංහල) - දෙවන ශ්‍රේණිය

## 1.0 හැඳින්වීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නමින් හැඳින්වෙන මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය මිනිසා සහ මිනිස් ප්‍රජාව කෙරෙහි විවිධ අයුරින් බලපෑම් කළා වූ හෝ කරන්නා වූ හෝ භෞතික, සමාජයීය සහ ජෛව පද්ධතීන් පිළිබඳ ව හා ඒවා පදනම් කරගෙන සිදු විය යුතු ඉගෙනුම් ක්‍රියාවලියකට යොමු කරන්නකි.

ළදරු වියේ සිට ම ස්වභාවයෙන් ම මිනිසා සිය වටාපිටාව කෙරෙහි කුතුහලයකින් පසු වන අතර ක්‍රම ක්‍රමයෙන් එම වටාපිටාව සමග සාර්ථක ව අන්තර්ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කර ගැනීමට උත්සාහ දරයි. මෙම ක්‍රියාවලියේ දී සිය සංවේදී ඉන්ද්‍රියයන් ප්‍රයෝජනයට ගන්නා අතර ම ඒවායේ සංවේදී බවත්, වර්ගීකරණය හා තර්කනය වැනි බුද්ධිමය හැකියාවනුත් වර්ධනය කර ගනියි. එසේ ම ඒ ඔස්සේ සිය වාග්මාලාව සහ සන්නිවේදන කුසලතා ද වර්ධනය කර ගනියි. තමා ජීවත් වන වටාපිටාව පිළිබඳ ව තොරතුරු සොයා බැලීම, රුස් කිරීම හා නැවත ප්‍රකාශ කිරීම දරුවාගේ ජීවිත ක්‍රියාවලියේ ම අංගයකි. මෙය නිරායාසයෙන් ම ඕනෑ ම ජීවියකු තුළ සිදු වන්නකි. දරුවාගේ එම නැඹුරුව පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගොඩ නැගීමේ පදනම විය.

එදිනෙදා ජීවිතයේ දී හමු වන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි හා රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයකුට විවිධ නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් මෙම කාර්යයට බෙහෙවින් දායක වේ. මීට පෙර ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවන් හි සෞන්දර්ය අධ්‍යාපනය, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ශාරීරික අධ්‍යාපනය හා ආරම්භක විද්‍යාව වැනි විෂයයන් එම කාර්යයට දායක විය. නව විෂයමාලාවේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් නම් වූ පුළුල් විෂය ක්ෂේත්‍රය යටතේ එම විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා අවස්ථානුකූල ව මතු කර ගැනීමට ඉඩ සළසා ඇත. එබැවින් මෙය සමෝධානික විෂයයකි.

පළමුවන ශ්‍රේණියේ දී ඉදිරිපත් කළ වත්තට එන සත්තු යන තේමාව හැර අනෙක් තේමා සියල්ල ඒ නමින්ම දෙවන ශ්‍රේණිය සඳහා ඉදිරිපත් කෙරේ. පළමුවන ශ්‍රේණියට වඩා පුළුල් පරාසයක් ආවරණය කිරීමට හැකි වන පරිදි එම තේමාව අප අවට සිටින සතුන් ලෙස වෙනස් කොට ඇත.

පළමුවන ප්‍රධාන අවධිය සඳහා තේමා 16ක් මත විෂය නිර්දේශය ගොඩ නගා ඇත. සෞන්දර්ය, නිර්මාණ හා ශාරීරික අධ්‍යාපන ක්ෂේත්‍රවලට අදාළ නිපුණතා මතු කර ගැනීම මෙන් ම ආගම, මව්බස හා ගණිතය යන ප්‍රධාන විෂයයන් පෝෂණය සඳහා ද පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යොදා ගත හැකි ය. දෙවන ශ්‍රේණියේ සිසුන්ගේ කතාබහට ගැළපෙන සරල ඉංග්‍රීසි වදන් මෙම ක්‍රියාකාරකම් මගින් මතු කර ගත හැකි ය.

විෂය නිර්දේශයේ ඇතුළත් සියලු කොටස් ඒ ආකාරයෙන් ම ශ්‍රී ලංකාවේ සෑම පාසලක ම කළ යුතු යැ යි අදහස් නො කෙරේ. මෙම අවධියේ දී දරුවන්ගේ පරිසරය සීමිත ය. එම සීමා ව තුළ ඇති දේ සහ සිදු වන දේ සියල්ල සෑම පාසලකට ම පොදු නොවේ. එහෙයින් සිසුන් සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේ දී සිය පාරිසරික සම්පත්වලට සරිලන සේ ඒවා තෝරා ගැනීමේ නිදහස හා වගකීම ගුරුවරයා සතු ය.

## 2. ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

පළමුවන ශ්‍රේණිය සිට පස්වන ශ්‍රේණිය තෙක් මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය පරිශීලනය කිරීමෙන් සිසුන් තුළ පහත දැක්වෙන නිපුණතා සංවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- සිය වටාපිටාවේ චමත්කාරය හඳුනා ගෙන ඒ තුළින් වින්දනයක් ලබයි.
- ක්‍රීඩාව, විවේකය, විනෝදය සිය ජීවිතයට අවශ්‍ය අංග ලෙස සලකා උචිත අයුරින් ඒවා සිය දින චර්යාවට මුසු කර ක්‍රියා කරයි.
- සෞන්දර්යාත්මක දේ අගය කරමින් ඒවා සිය ප්‍රකාශන කාර්යයන්හි දී භාවිත කරයි.
- නිරෝගිමත් දිවි පැවැත්මකට අවශ්‍ය මූලික හුරුකම් ලබයි.
- මිනිස් නිර්මාණ අගය කරයි.
- සිය වටාපිටාවේ සිටින ජීවීන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- මිනිස් සමාජය, මිනිස් හැසිරීම් හා මිනිසා කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- පෘථිවිය, එහි සම්පත් හා අවකාශය මිනිසා කෙරෙහි බලපාන අයුරු ගවේෂණය කරයි.
- පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලියේ සිය වගකීම අවබෝධ කර ගෙන ඒ අනුව කටයුතු කරයි.
- සිය වටාපිටාවේ ශක්තිය සහ බලය යෙදීම ප්‍රජාවේ ඉදිරි ගමනට බලපාන අයුරු විමර්ශනාත්මක ව අගය කරයි.
- තම පරිහරණයේ ඇති භාණ්ඩ හා උපකරණ නිවැරදි ව හැසිරවීම මගින් අනාගත වැඩ ලෝකයට අවශ්‍ය හුරුව ලබයි.

3. පළමුවන ප්‍රධාන අවධියේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළ ඉගෙනුම් නිපුණතා

- පාසල් පරිසරයට අනුගතව කටයුතු කරයි.
- නිවසේ දී සතුටින් හා ඵලදායි ලෙස පුද්ගලයන් අතර අන්තර් සම්බන්ධතාවල නියැලෙයි.
- තොරතුරු රැස් කිරීම සඳහා නිරීක්ෂණ කරයි.
- අත්දැකීම් තුළින් සරල ක්‍රියාකාරකම්වල නියැලෙයි.
- සිරිත් විරිත්වලට අනුකූලව ක්‍රියාකරයි.
- පාසල හා සම්බන්ධ අතීත තොරතුරු විමසා බලයි.
- සෞඛ්‍යවත් දිවිපෙවතක් සඳහා යහපත් පුරුදු අනුගමනය කරයි.
- සුහද කතා බහ ඔස්සේ නිවැරදි ව තොරතුරු හුවමාරු කර ගනියි.
- අවට පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ සංවේදී ව කටයුතු කරයි.
- තමා හා තම අවට පරිසරය පිරිසිදු ව ක්‍රමවත් ව පවත්වා ගැනීමට දායක වෙයි.
- අන් අයට ප්‍රියජනක අන්දමින් තම ගති පැවතුම් පවත්වා ගනියි.
- මූලික ඉරියව් නිවැරදි ව පවත්වා ගනියි.
- එදිනෙදා කටයුතුවල දී සිය ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
- අවකාශය උචිත ලෙස භාවිත කරමින් ක්‍රීඩා හා ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- අරමුණු ගත කාර්යයන් සඳහා සාමූහික ව වගකීමෙන් වැඩ කරයි.
- පරිසර විවිධත්වය කෙරෙහි සංවේදී ව ක්‍රියා කරයි.
- අවශ්‍ය අවස්ථාවල දී අන් අයට උදව් කිරීමට ඉදිරිපත් වෙයි.
- රූප සංකේත හා ලිඛිත පුවරු මගින් දැක්වෙන තොරතුරු ලබා ගනියි.
- තම අත්දැකීම් චිත්‍ර හා ඇඹීම් මගින් ප්‍රකාශ කරයි.
- පරිසරයේ ශබ්ද, නාද, චලන සහ චරිත නිරූපණය කරයි.
- අභිනය දක්වමින් රංගනයේ හා ගායනයේ නිරත වෙයි.
- විවිධ කටයුතුවල දී සමායෝජනයෙන් යුතු ව චලන දක්වයි.
- විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් විවිධ දේ නිර්මාණය කරයි.
- ලබාගත් අත්දැකීම් හා රැස් කරන ලද තොරතුරු තනිව හෝ සාමූහික ව හෝ පිරිසකට ඉදිරිපත් කරයි.
- නිවසේ දී හා පාසලේ දී සිය යුතුකම් හා වගකීම් පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යොමුවක්

* මෙම නිර්දේශයේ දී දරුවාගේ වටාපිටාව තේමා 16ක් ඔස්සේ විකාශ කර ඇත.
* සියලු දැ තෘප්තිමත් අත්දැකීම් වශයෙන් ලබා ගැනීමට සිසුනට ඉඩ සැපයිය යුතු මෙන් ම ඒ සඳහා ප්‍රමාණවත් සැලැස්මක් හා සූදානමක් අවශ්‍ය වනු ඇත.
* මෙහි ඇති අදහස්වලට අනුකූල ව ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රම යොදා පාඩම් සැලසුම් කර ගත යුතු ය. තොරතුරු වාර්තා කිරීම, තොරතුරු සොයා ගැනීම තරම් ම වැදගත් ය. මුල් අවධියේ දී වාචික ව හා කටු සටහන් මඟින් සිය අත්දැකීම් ප්‍රකාශ කිරීමට සිසුන් පොළඹවන්න. ක්‍රමයෙන් වචන ද වාක්‍ය ද තරමක් සවිස්තරාත්මක රූප සටහන් ද යොදා ගැනීමට සිසුන් යොමු කරන්න.
* සිසුන්ගේ වැඩ මෙන් ම හා උත්සාහය ද අගය කළ යුතු ය.
* හැකි සෑම මොහොතක ම සිසුන් කණ්ඩායම් වශයෙන් වැඩෙහි යොදවන්න. එහෙත් මුල් අවස්ථාවල දී කණ්ඩායමක සාමාජිකයකු වශයෙන් වැඩ කළ යුතු ආකාරය පිළිබඳ ව සිසුන්ට පුහුණු කළ යුතු ය.
* යම් තේමාවකට සම්බන්ධ ව ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු කර ගෙන යන අතර ක්‍රම ක්‍රමයෙන් එක් රැස් වන තොරතුරු හා ද්‍රව්‍ය තේමාවක් අවසානයේ පැවැත්වෙන ප්‍රදර්ශනයක් හෝ සම්මන්ත්‍රණයකින් හෝ කෙළවර කරන්න.
* තේමා ඉදිරිපත් කර ඇත්තේ නිශ්චිත අනුපිළිවෙළකට නොවේ. අවස්ථාවට උචිත ලෙස තේමාවන් තෝරා ගැනීමට ගුරුවරයාට නිදහසක් ඇත.
* සැමවිටම සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වීම වැදගත් ය.

## 5. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉගැන්වීමට වඩා, ඉගෙනුමට මුල් තැනක් දෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකි. කණ්ඩායම් හා තනි තනි ව ද වරෙක මුළු පන්තිය ම ද ඉගෙනුම් කාර්යවල යෙදවිය හැකි ය.

ගුරුවරයා මේ සඳහා කල් ඇති ව සැලසුම් කර ගත යුතු ය. එක ම මොහොතක විවිධ කණ්ඩායම් එකිනෙකට වෙනස් වැඩවලට යැමට හැකි ය. ඒ මඟින් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කර ගැනීමට හැකි ය.

සිසුන් සඳහා සැලසුම් කරන වැඩ අතර නිරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, අත්හදා බැලීම්, කෙටි ව්‍යාපෘති, රැස් කිරීම්, භූමිකා රංගන, වැනි විවිධ ඉගෙනුම් ක්‍රමෝපාය ද පුද්ගලයන්ගෙන්, පොත්පත් වැනි මුද්‍රිත මාධ්‍යවලින් ද විද්‍යුත් මාධ්‍යවලින් ද තොරතුරු රැස් කිරීම් අඩංගු විය හැකි ය.

## 6. පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

නිර්මාණාත්මක, සෞන්දර්යාත්මක හා ශාරීරික නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා වූ පුළුල් පරාසයක ඉගෙනුම්-ඉගැන්වීම් අත්දැකීම් සපුරාලීමේ අවශ්‍යතාව නව විෂය නිර්දේශය දක්නට ලැබෙන පැහැදිලි වෙනසකි. එවැනි වෙනසක් සඳහා පන්ති කාමරය පමණක් නොව සම්පූර්ණ පාසල් පරිසරය ද එවැනි සිසුන් දෙස බලන දෘෂ්ටි කෝණය ද වෙනස් විය යුතු ය.

එබැවින් පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය වීමේ දී දවස පුරා මේසය අසල පුටුවක වාඩි වී සිටිම වෙනුවට විවිධ ඉරියව්වෙන් හා සතුටෙන් නොයෙකුත් ක්‍රියාකාරකම්වල නිරත වන දරුවන් දැකිය හැකි වන පරිදි ය.

මේ සඳහා සැලසුම් කරනු ලබන පන්තියක තිබිය යුතු ලක්ෂණය මෙසේ ය.

* පාසල් කාලය තුළ දී මෙම සිසුන්ට ප්‍රධාන වශයෙන් සෙල්ලම් ස්වරූපයක් ගත් ක්‍රියාකාරකම්වල නිරත වීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම.
* එළිමහනේ ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සැපයීම.
* පාසලේ ක්‍රීඩා, සෞන්දර්යාත්මක කටයුතු හා වෙනත් විෂය සමගාමී කටයුතු කෙරෙහි ද අවධානය යොමු කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7. තක්සේරු කිරීම

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා සම්බන්ධ තක්සේරු කිරීමේ දී එම ඉගෙනුම් කාර්යය තුළින් සිසුනට ලබා දීමට බලාපොරොත්තු වන දැනුම, කුසලතා හා ආකල්ප සහ පුරුදු සැලකිල්ලට ගත යුතු ය. එසේ ම සමාජයීය දක්ෂතා කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

ඒ ඒ සිසුන් කණ්ඩායම් හෝ තනි තනි සිසුන් තුළ ඇති ඌණතා, මතු ඉගෙනුම් කටයුතුවල දී මගහරවා ගැනීමේ අරමුණෙන් මෙම තක්සේරු කිරීම් කළ යුතු ය.

මෙහි දී බොහෝ විට විධිමත් ඇගයීම් ක්‍රමවලට පරිබාහිර ක්‍රම අනුගමනය කිරීමට සිදු වේ. සිසුන් වැඩෙහි යෙදී සිටින අවස්ථාවල ඔවුන් නිරීක්ෂණයෙන්, සවන් දීමෙන් සහ ඔවුන් සමග සාකච්ඡා කිරීමෙන් මෙම අවස්ථා මතු කර ගත හැකි වනු ඇත. ඒවා ක්‍රමවත් ව වාර්තා කර ගැනීමට ගුරු අත්පොතෙහි ඇතුළත් තක්සේරු වාර්තා සටහන් භාවිත කළ හැකි ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තේමාව :- 1.0 අපයි පාසලයි

**නිපුණතා :-**

පාසල තුළ කටයුතු කරන විවිධ පුද්ගලයන්ගේ භූමිකා හඳුනාගෙන නිසි අයුරින් ප්‍රතිචාර දක්වයි.
අන් අය සුහද ව පිළිගෙන අවස්ථානුකූල ව කටයුතු කරයි.
ආචාරශීලී ව හැසිරීම ප්‍රදර්ශනය කරයි.
එකමුතු බව සාර්ථකත්වයට හේතු වන බව පිළිගනිමින් ඒ අනුව ක්‍රියා කරයි.
පාසල් වත්තේ සහ ඒ අවට ඇති සුවිශේෂී මෙන් ම වැදගත් ශාක, ස්ථාන හා ලක්ෂණ හඳුනාගෙන ඒවා සුරක්ෂිතව පවත්වා ගැනීමට දායක වෙයි.
ගමෙන් පාසලට හා පාසලෙන් ගමට ඉටුවන සේවා හඳුනාගෙන තමාට හැකි මට්ටමෙන් එම සේවාවන්ට දායක වෙයි.
පාසල තමාට සුරක්ෂිත ස්ථානයක් මෙන් ම ප්‍රියජනක හා ප්‍රයෝජනවත් ස්ථානයක් ලෙස හඳුනාගෙන කටයුතු කරයි.
ක්‍රීඩා පිටිය ඉතා ප්‍රයෝජනවත් ස්ථානයක් ලෙස පිළිගෙන එය හොඳින් පවත්වා ගැනීමට දායක වෙයි.

**අන්තර්ගතය :-**

- ප්‍රාථමික ශ්‍රේණිවල උගන්වන ගුරුවරුන් පිළිබඳ තොරතුරු
පාසලට සුවිශේෂ වූ ශාක/ස්ථාන/ලක්ෂණ පිළිබඳ ව තොරතුරු
පාසල අවට පිහිටි සුවිශේෂ ස්ථාන සහ ස්වභාවික දේ
ප්‍රජාවෙන් පාසලටත් පාසලින් ප්‍රජාවටත් කෙරෙන සේවාවන්
විවිධ මාධ්‍ය භාවිත කරමින් අවට පරිසරයේ තමන් සිත්ගත් ස්ථාන දැක්වෙන නිර්මාණ
ප්‍රජාව තුළින් හඳුනා ගන්නා සුවිශේෂ චරිත අනුකරණය
පාසල් ගීය ගායනය
"අපේ පාසල" සිත්ගත් නිර්මාණ ප්‍රදර්ශන

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

උදෑසන රැස්වීමක දී විදුහල්පති හා ප්‍රාථමික ශ්‍රේණිවල ගුරුවරුන් හඳුනා ගැනීම සඳහා වැඩ සටහනක් සැලසුම් කිරීම. ප්‍රාථමික ශ්‍රේණිවල ගුරුවරුන් සිටින ස්ථාන නිරීක්ෂණය හා විවිධ අයුරින් වාර්තා කිරීම.
පාසල් වත්ත නිරීක්ෂණයට යොමු කරමින් ශාක, පාසලට සුවිශේෂ ස්ථාන පිළිබඳ තොරතුරු රැස් කිරීම.
තොරතුරු විවිධ ක්‍රමවලින් වාර්තා කිරීම (වාචික, චිත්‍ර, ආකෘති, ශාක කොටස් ඇසුරින් මෝස්තර නිර්මාණ, ගායන හා රංගන)
ප්‍රජාවෙන් පාසලටත්, පාසලෙන් ප්‍රජාවටත් කෙරෙන විවිධ සේවා පිළිබඳ සාකච්ඡා කිරීම හා එවැනි අවස්ථාවලට සහභාගි වීමට ඉඩ සැලැස්වීම. එවැනි වැඩ සටහන් පිළිබඳ ව දැනුවත් කිරීම පෙරහැරවල් සංවිධානය කිරීම. (උදා : ඩෙංගු මර්ධනය, රුක්රෝපනය, පෝෂණ වැඩ සටහන්, පෙරහැරවල් සංවිධානය කිරීම.)
පාසල් කොඩිය ඔසවා පාසල් ගීය සාමූහික ව ගායනය කිරීම.
තේමාව අවසානයේ පන්ති මට්ටමින් ප්‍රදර්ශන පැවැත්වීම.
සෙල්ලම් මිදුල හා ක්‍රීඩා පිටිය තුළ දී විවිධ කණ්ඩායම් ක්‍රීඩා සඳහා සහභාගි වීම.

තේමාව :- 2.0 අපේ ගෙදර

**නිපුණතා :-**

විවිධ ස්ථානවලට සාපේක්ෂ ව තම නිවසේ පිහිටීම ප්‍රකාශ කරයි.
පවුලේ සම්පතම නෑදෑයින් හා නෑදෑ සබඳතා පිළිබඳ තොරතුරු සොයා බලා ප්‍රකාශ කරයි.
තම නිවසට පැමිණෙන නෑදෑයින්, හිතමිතුරන්, අමුත්තන් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතු ව කටයුතු කරයි.
නිවසේ මූලික අවශ්‍යතා හා ඒවා ලැබෙන ක්‍රම වාර්තා කරයි.
නිවසට අවශ්‍ය විවිධ ආහාර ද්‍රව්‍ය ගෙවත්තෙන් ලබා ගැනීමට දායක වෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

නිවසේ පරිසරය පිරිසිදුව, අලංකාරව හා ආරක්ෂා සහිත ව තබා ගැනීමට දායක වෙයි.
නිවසට විවිධ ද්‍රව්‍ය සපයන අයගේ චරිත භූමිකා රංගන ඇසුරින් ඉදිරිපත් කරයි.
නිවසේ කටයුතු පහසු කර ගැනීමට සහ අලංකාරය සඳහා යොදා ගත හැකි දේ නිර්මාණය කරයි.
වින්දනාත්මකව හා සාමූහික වශයෙන් ගෘහස්ත ක්‍රීඩාවල නියැලෙයි.

**අන්තර්ගතය :-**

- තම නිවසෙහි සාපේක්ෂ පිහිටීම වාචික ව හා රූපිකව
- සිය පවුලේ සමීපතම නෑදැයන්ගේ නෑ සබඳතා හා මූලික තොරතුරු
- තම නිවසට අවශ්‍ය මූලික දේවල් සැපයෙන ක්‍රම හා ස්ථාන
- තම නිවස හා අවට අලංකාරය සහ ආරක්ෂාව සඳහා ගෙන ඇති පියවර
- නිවසට හිරු එළිය හා වාතය ලැබෙන ආකාරය
- නිවසේ සාමාජිකයන් කරනු ලබන විවිධ කාර්යයන් අනුකරණය හා භූමිකා රංගන
- නිවස අලංකරණය කළ හැකි නිර්මාණ
- ගෘහස්ත ක්‍රීඩා

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

- තම නිවසේ පිහිටීම පිළිබඳ අන් අයට ප්‍රකාශ කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි (සෙල්ලම් ගෙවල්) නිරත වීම.
- නිවසේ ආකෘති තැනීම හා කණ්ඩායම් වශයෙන් ආකෘති එකතු කර ගමක් නිර්මාණය කිරීම
- නෑදැයන් හා නිවෙසට පැමිණෙන අය පිළිගැනීම් හා සංග්‍රහ කිරීම් පිළිබඳ දැනුවත් වීම් සඳහා භූමිකා රංගනවල යෙදීම හා පවුලේ සාමාජිකයන් දැක්වෙන චිත්‍ර නිර්මාණය කිරීම
- නිවසට අවශ්‍ය ද්‍රව්‍ය සපයන්නේ කවු ද, කොහෙන් ද යන්න සාකච්ඡා කිරීම සහ ගායන රංගන මෙන් ම විවිධ ද්‍රව්‍යවල ආකෘති නිර්මාණ වැනි ක්‍රියාකාරකම් මඟින් තොරතුරු වාර්තා කිරීම
- නිවසේ අලංකාරය හා පවිත්‍රතාවය ආරක්ෂා කර ගැනීමට සහ වාතාශ්‍රය ලැබීමේ අවශ්‍යතාවය පැහැදිලි කිරීම සිසු අත්දැකීම් ඇසුරින් සාකච්ඡා කිරීම
- පාසලේ මෙම ලක්ෂණ කෙතෙක් දුරට තිබේ ද යන්න පිළිබඳ නිරීක්ෂණවල නිරත වීම හා විවිධ අයුරින් වාර්තා කිරීම (දෙබස්, ගායන රංගන)
- නිවසේ දී කළ හැකි විවිධ ක්‍රීඩාවලට සහභාගි වීම

## තේමාව :- 3.0 වත්තට එන සත්තු

**නිපුණතා :-**

- විවිධ ලක්ෂණ අනුව අවට පරිසරයේ සිටින සතුන් කාණ්ඩ කරයි.
- සතුන්ගේ පැමිණීම හා හැසිරීම ආදි ක්‍රියාවන්ට දවසේ කාලය අතර සම්බන්ධතාවක් ඇත් දැයි විමර්ශනය කර වාර්තා කරයි.
- සතුන් හා ගස්වැල් අතර ඇති අන්තර් සම්බන්ධතාවය පිළිබඳ ව විමසිලිමත් වෙයි.
- සතුන්ට ආවේණික චර්යා ඇසුරෙන් දෛනික ජීවිතයේ දී මිනිසාට ප්‍රයෝජනවත් වන චර්යා විමසා බලයි.
- නිර්මාණාත්මක ව සත්ත්ව චර්යා නිරූපණය කරයි.
- විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් සත්ත්ව ආකෘති නිර්මාණය කරයි.
- සතුන් හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැලෙමින් වින්දනයක් ලබයි.

**අන්තර්ගතය :-**

- සමීප පරිසරයේ හැසිරෙන සතුන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතා
- සතුන් සහ වත්තේ ගස්වැල් අතර ඇති සම්බන්ධතාව
- සතුන්ගේ චර්යා හා හඬ අනුකරණය
- සත්ත්ව ආකෘති නිර්මාණය
- සතුන් හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩා
  මිනිසා විවිධ ප්‍රයෝජන සඳහා ඇති කරන සතුන් තුළ පවත්නා හොඳ පුරුදු පිළිබඳ ව තොරතුරු සහ අත් දැකීම්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

පාසල් වත්තේ/ආසන්න පරිසරයේ ගැවසෙන සතුන් නිරීක්ෂණයට යොමු කිරීම හා සතුන් කාණ්ඩ කළ හැකි ආකාර පිළිබඳ සාකච්ඡා කිරීම
සතුන්ගේ හඬ හා හැසිරීම අනුකරණය කිරීම හා සතුන් පිළිබඳ ගායනා හා රංගනවල යෙදීම
සත්ත්ව ආකෘති නිර්මාණය කිරීම
සතුන් හා ගස්වැල් අතර සම්බන්ධතාවය හඳුනා ගැනීමට නිරීක්ෂණවල යෙදීම සහ විවිධ අයුරින් වාර්තා කිරීම
සතුන්ගෙන් ගස්වැල්වලට සිදුවන ප්‍රයෝජන හා හානි පිළිබඳ අත්දැකීම් කතා බහ කිරීම
සතුන්ගේ හොඳ පුරුදු ඇතුළත් කෙටි නාට්‍ය රඟ දැක්වීම, කවි ගී ගායනා රංගන හා ක්‍රීඩාවල යෙදීම

## තේමාව :- 4.0 ජලය සමඟ සෙල්ලම්

**නිපුණතා :-**

ගලායන ජලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව විමර්ශනය කර වාර්තා කරයි.
ජලයෙන් ගත හැකි ප්‍රයෝජන අත්හදා බලමින් ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
තම ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් තැනකින් ජලය ඉවත් කිරීමේ විවිධ ක්‍රම ආදර්ශනය කරයි.
ගලායන ජලයෙන් ක්‍රියාකරවිය හැකි විවිධ උපකරණ සාදයි.
වින්දනය සඳහා ජලය ඇසුරින් ශබ්ද හා නාද නිර්මාණය කරයි.
ජලය භාවිත කරමින් කළ හැකි ක්‍රීඩා කිහිපයක නියැලෙයි.

**අන්තර්ගතය :-**

- ගලායන ජලයෙන් සිදුවන හා සිදු කර ගත හැකි දේවල්
- බොහෝ දේවල් ඉවත් කර ගැනීමට ජලය යොදා ගන්නා බව
- ජලය ඉවත් කර ගැනීමට යෙදිය හැකි ක්‍රම උපයෝගී කර ගනිමින් ජලයෙන් සෝදා ඉවත් කළ හා කළ නොහැකි දේ.
- ජලය උපයෝගී කර ගනිමින් ශබ්ද හා නාද නිර්මාණ
- ජලය උපයෝගී කර ගනිමින් භාවිත කළ හැකි නිර්මාණ
- ජලය මඟින් සිදුවන අනතුරුවලින් ආරක්ෂා වන ආකාරය
- ජලය භාවිතයෙන් කෙරෙන ක්‍රීඩා

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

ජලය ගලා යාම සහ ගලා යන ජලයට ද්‍රව්‍ය දැමීමෙන් සිදුවන දේ නිරීක්ෂණය හා වාර්තා කිරීම.
ජලය උපයෝගී කර ගනිමින් භාවිත කළ හැකි නිර්මාණ කිරීම.
ගලා යන ජලයෙන් ඇති ප්‍රයෝජන පිළිබඳ ව සාකච්ඡා කිරීම.
බොහෝ දේ ඉවත් කිරීමට ජලය යොදා ගන්නා බව පෙන්නුම් කෙරෙන ප්‍රායෝගික ක්‍රියාකාරකම් කිරීම
තැනකින් ජලය ඉවත් කර ගැනීමට යෙදිය හැකි ක්‍රම අත්හදා බැලීම
ජලය ඇසුරින් ශබ්ද හා නාද නිර්මාණ හා ජලය පිළිබඳ කවි ගී ගායනා හා රංගන කිරීම
ජලය හා සම්බන්ධ නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදීම

## තේමාව :- 5.0 අවුරුදු කාලය

**නිපුණතා :**

අවුරුදු සමයේ අවට පරිසරයේ සහ තමන් ජීවත් වන සමාජ පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ අත්දැකීම් බෙදා හදා ගනියි.
අලුත් අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ඉටු කරමින් උත්සවයක් පැවැත්වීමට දායක වෙයි.
අවුරුදු සමයේ අවට පරිසරයේ දක්නට ලැබෙන සුන්දරත්වය අර්ථවත් වන ගායන, වාදන සහ රංගන ඉදිරිපත් කරයි.
අන් ජාතීන්ගේ අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවලට ගරුත්වයෙන් යුතු ව කටයුතු කරයි.
අවුරුදු දිනවල සිදුවිය හැකි පොදු අනතුරු හඳුනාගෙන ආරක්ෂාකාරීව ක්‍රියා කරයි.
අවුරුදු කාලයේ සිදුවන ජන ක්‍රීඩා කිහිපයක සාමූහික ව නියැලෙයි.
අවුරුදු කාලවල දී පිළියෙල කෙරෙන කැවිලිවල ආකෘති හා අවුරුදු අසිරිය දැක්වෙන චිත්‍ර නිර්මාණය කර ප්‍රදර්ශනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**අන්තර්ගතය :-**

- සිංහල හා හින්දු අලුත් අවුරුද්ද කාලයේ ප්‍රදේශයේ කාලගුණික, ආර්ථික සහ සමාජයීය වශයෙන් සිදුවන වෙනස්කම්
- සිංහල හා හින්දු අලුත් අවුරුද්දේ නැකත් සහ ඒ හා බැඳුනු සිරිත් විරිත් පිළිබඳ ව තොරතුරු
- අපේ සහ අපේ පැරැන්නන්ගේ අවුරුදු සිරිත් විරිත් හා කෙළි සෙල්ලම් අතර සමානකම් හා වෙනස්කම් පිළිබඳ ව දැන ගැනීම හා ඉන් කීපයක් අනුකරණය
- විවිධ ජාතීන්ගේ අවුරුදු පිළිබඳ තොරතුරු
- අවුරුදු සමයේ ප්‍රදේශයේ සිදුවන යහපත්/අයහපත් සිදුවීම් පිළිබඳ ව තොරතුරු
- අවුරුදු සම්බන්ධ ක්‍රීඩා
- අවුරුදු කාලයට සුවිශේෂ වූ කවි, ගීත ගායනය හා රංගන (ආදේශක භාණ්ඩ භාවිත කරමින්)
- අවුරුදු කාලවල දී පිළියෙල කෙරෙන කැවිලිවල ආකෘති හා චිත්‍ර නිර්මාණ හා ප්‍රදර්ශන

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

- අවුරුදු කාලවල දී සිදුවන චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ සෙල්ලම් අවුරුදු උත්සව ඇසුරින් අත්දැකීම් ලැබීම
- පාසලේ හෝ ප්‍රදේශයේ වැඩිහිටියකුගෙන් උත්සව චාරිත්‍ර පිළිබඳ ව දැනුවත් වීම
- අවුරුදු සමයේ දැකිය හැකි වෙනස්කම් පිළිබඳ ව සාකච්ඡා කිරීම
- අවුරුදු සමයේ කෙරෙන ක්‍රීඩාවන්හි නියැළීම
- අවුරුදු කාලයේ දී සිදුවිය හැකි අනතුරු පිළිබඳ ව දැනුවත් වීම සඳහා ආසන්න අත්දැකීම්, පුවත් පත් තොරතුරු, පින්තූර ඇසුරින් සාකච්ඡා කිරීම
- අවුරුදු කාලවල සිදු කෙරෙන විවිධ කාර්යයන් අතුරින් කැමති අවස්ථා චිත්‍රයට නැගීම සහ අවුරුදු කාලවල පිළියෙල කෙරෙන කැවිලි පෙවිලිවල ආකෘති නිර්මාණය

## තේමාව :- 6.0 අපට පෙනෙන අහස

**නිපුණතා :-**

දවසේ විවිධ අවස්ථාවල දී අහසේ හා අවට පරිසරයේ සිදුවන වෙනස්කම් විමර්ශනය කර වාර්තා කරයි.
වින්දනාත්මක ව අත්හදා බලමින් සුළඟ උපයෝගී කර ගෙන ද්‍රව්‍ය අහසේ පා කරයි.
හිරු එළිය එදිනෙදා කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන ආකාරය විමසා බලා වාර්තා කරයි.
අධික හිරු එළිය නිසා වන පීඩාවලින් මිදීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරයි.
අහසේ චමත්කාරය අගයමින් කවි, ගී ගායනා, රංගන හා කතන්දර ඉදිරිපත් කරයි.
විවිධ මාධ්‍ය භාවිත කරමින් අහසේ චමත්කාරය දැක්වෙන නිර්මාණ කරයි.
අවකාශය භාවිත කරමින් ක්‍රීඩාවල නිරත වෙයි.

**අන්තර්ගතය :-**

- රාත්‍රිය ළඟා වන හා නිමා වන අවස්ථාවල අහසේ සහ අවට සිදු වන දේ
- දහවල් අහසේ ලක්ෂණ, හිරු එළියෙන් ඇති ප්‍රයෝජන හා අධික හිරු එළියෙන් විය හැකි පීඩාවලින් මිදිය හැකි මාර්ග
- අහසේ යමක් පා කර යැවීමට යෙදිය යුතු උපක්‍රම
- අහසේ චමත්කාරය දනවන කවි ගී, කතන්දර
- විවිධ මාධ්‍ය භාවිත කරමින් අහසේ චමත්කාරය නිර්මාණය
- අවකාශ භාවිතය තුළින් ක්‍රීඩා

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

රාත්‍රිය ළඟා වන විට හා නිමා වන විට අවට පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කිරීම හා වාර්තා කිරීම
ස්වභාවික වස්තූන් පිළිබඳ කවි, ගීත ගායනා, රංගන හා කතන්දර ඉදිරිපත් කිරීම
අහසේ චමත්කාරය නිරීක්ෂණය කර චිත්‍රයට නැගීම හා වෙනත් නිර්මාණ කිරීම
දහවල් කාලයේ අහසේ ස්වභාවය නිරීක්ෂණය කර හඳුනා ගත් ලක්ෂණ විවිධ අයුරින් වාර්තා කිරීම
අහසේ යමක් පාකර හැරීමට යෙදිය හැකි උපක්‍රම අත්හදා බැලීම
අවකාශ භාවිතයට අදාළ ව ක්‍රීඩාවල නියැළීම

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තේමාව :- 7.0 අප කන බොන දේ

**නිපුණතා :**

ආහාර වේලක අඩංගු දෑ සොයා බලා එහි වැඩිපුරම ඇත්තේ මොනවා දැ යි ප්‍රකාශ කරයි.
ආහාර වේලක් පිළියෙල කර ගැනීමට ශාකවලින් හා සතුන්ගෙන් ලබා ගන්නා දෑ විමර්ශනය කර වාර්තා කරයි.
ආහාරවලින් අපගේ ශරීරයේ වර්ධනයට හා ආරක්ෂාවට ලැබෙන විවිධ ප්‍රයෝජන අගය යි.
ආහාරයක් ලෙසට පලාවර්ගවල ඇති වටිනාකම් පිළිබඳ ව අවබෝධයකින් යුතු ව දෛනික ආහාර වේල් සඳහා පලා වර්ග එකතු කර ගනියි.
රෝගවලින් වැලකී සිටීමට අවශ්‍ය කරන ආහාර රටා අනුගමනය කරයි.
ආහාර මෙන් ම සුදුසු පාන වර්ග ද ප්‍රමාණවත් ව ගැනීම පුරුද්දක් කර ගනියි.
ආහාරවල වැදගත්කම හා යහපුරුදු සෞන්දර්යාත්මක ව ඉදිරිපත් කරයි.
මනා ශරීර වර්ධනයක් සඳහා යෝග්‍ය ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**අන්තර්ගතය :-**

- අපේ ආහාර වේලෙහි ප්‍රධාන ආහාරය වශයෙන් පිටි බහුල (පිෂ්ඨය බහුල) ද්‍රව්‍යයක් අඩංගු වන බව
- අපේ ආහාරයට එකතු වන දේවල් ප්‍රධාන වශයෙන් ගස්වලින් හා සතුන්ගෙන් ලබා ගන්නා බව
- ශරීර වර්ධනයට මෙන් ම ආරක්ෂාවට සුදුසු අහාර හා පාන වර්ග
- ප්‍රධාන ආහාරයට එකතු වන වෙනත් ආහාරවලින් අපේ වැඩීමට අවශ්‍ය දෑ
- සිය සිරුරේ වැඩීම හා නීරෝගී බව
- ආහාර පිළියෙල කරන විවිධ ආකාර
- අහාරවල වැදගත්කම හා යහපුරුදු මතු වන ගායන, රංගන හා කෙටි නාට්‍ය
- ශරීර වර්ධනයට යෝග්‍ය ක්‍රියාකාරකම්

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

ආහාර වේලක් ශාක හා සතුන්ගෙන් ලබා ගන්නා දේවල්වලින් සමන්විත වන බව හා ආහාර වේලක ප්‍රධාන වශයෙන් පිටි බහුල බව පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම සඳහා ආහාර කොටස් නිරීක්ෂණය කිරීම
සිය සිරුරේ වැඩීම පිළිබඳ අත්දැකීම් සාකච්ඡා කිරීම
පලතුරු සලාදයක් හෝ පලතුරු බීමක්, වැනි පානයක් හෝ වෙනත් ආහාරයක් පත්ති මට්ටමින් පිළියෙල කිරීම
ආහාරවල ගුණාංග හෝ ආහාර පුරුදුවල වැදගත්කම පිළිබඳ තවදුරටත් දැනුවත් වීම සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම
කායික වර්ධනයට අදාළ ක්‍රීඩාවල යෙදීම
විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් ආහාර වර්ගවල ආකෘති සකස් කිරීම

තේමාව :- 8.0 තොරතුරු ලැබෙන හැටි

**නිපුණතා :-**

අදහස් හා හැඟීම් නිවැරදි ව ප්‍රකාශ කිරීම සඳහා කටහඬ සහ ඉන්ද්‍රියයන් අදාළ පරිදි යොදා ගනියි.
තොරතුරු සන්නිවේදනය කිරීම පහසු මෙන් ම, වින්දනාත්මක වීම සඳහා කාටූන් චිත්‍ර, ඡායාරූප හා පෝස්ටර් යොදා ගනියි.
බිත්ති පුවත්පතක් සඳහා තම දායකත්වය ලබා දෙමින් ආශ්වාදයක් ලබයි.
නිවැරදි තොරතුරු ලබා ගැනීමේ හා ලබා දීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.

**අන්තර්ගතය :-**

- අදහස් සහ හැඟීම් ප්‍රකාශ කිරීමට ඉන්ද්‍රිය භාවිතය
- ඡායාරූප, කාටූන් පෝස්ටර් සහ චිත්‍ර මඟින් ප්‍රකාශ වන තොරතුරු වඩා නිවැරදි ව අවබෝධ කර ගැනීමේ හා ප්‍රකාශ කිරීමේ හැකියා වර්ධනය
- විවිධ ප්‍රචාර කටයුතු සඳහා මුද්‍රිත මාධ්‍ය භාවිත කරන අවස්ථා
- බිත්ති පුවත්පත් නිර්මාණය
- තොරතුරු ලබා දීමේ හා ලබා ගැනීමේ ක්‍රීඩා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

- අදහස් හා හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා ඉන්ද්‍රිය යොදා ගන්නා ආකාරය පිළිබඳ ව අත්දැකීම් ලැබීමට ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි යෙදීම. මේ සඳහා සිසුන් යුගල හා කුඩා කණ්ඩායම් කරමින් කතා බහ කිරීම සහ මුහුණුවලින් හැඟීම් ප්‍රකාශ කිරීම.
- ඡායාරූප, කාටූන්, පෝස්ටර්, පුවත් පත් මඟින් රැස් කර ගන්නා තොරතුරු පිළිබඳ ව සාකච්ඡා කිරීම.
- නිවැරදි තොරතුරු ලබා දීමේ හා ලබා ගැනීමේ කණ්ඩායම් ක්‍රීඩාවල නියැළීම.

## තේමාව :- 9.0 වටාපිටාවේ සිදු වන වෙනස්කම්

**නිපුණතා :-**

- දෛනික ක්‍රියාකාරීත්වය නිසා ආසන්න පරිසරයේ සිදුවන වෙනස්කම්වලට සංවේදීව ප්‍රතිචාර දක්වයි.
- ස්වභාවික හේතු නිසා පරිසරයේ සිදුවන වෙනස්කම්වලට අනුව සංවේදීව කටයුතු කරයි.
- ආසන්න පරිසරයේ සිදුවන වෙනස්කම් අතුරින් අහිතකර වෙනස්කම් හිතකර බවට පත් කර ගැනීමට දායක වෙයි.
- පරිසරයේ සිදුවන වෙනස්කම් නිර්මාණ, රංගන, ගායන හා වාදන මඟින් ඉදිරිපත් කරයි.
- පරිසරයේ වෙනස්කම් දැක්වෙන නිර්මාණ විවිධ මාධ්‍ය භාවිතයෙන් ඉදිරිපත් කරයි.

**අන්තර්ගතය :-**

- සිය සමීප පරිසරයේ සිදුවන වෙනස්කම්
- මෑත කාලයේ (වසරක් තුළ පමණ) සුළඟ, වැස්ස, ඉඩෝරය වැනි ස්වාභාවික හේතූන් නිසා ගමට/නගරයට/ වීදියට සිදු වී ඇති අහිතකර බලපෑම් සහ ඒවාට මුහුණ දෙන ආකාරය.
- ස්වභාවික පරිසරයේ වෙනස්වීම් නිරූපණය

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

- සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් (පාසල ආරම්භය, පාසල් කාලය තුළ, පාසල් ඇරෙන වේලාව වැනි) නිරීක්ෂණය කිරීම හා පරිසරයට අහිතකර විය හැකි වෙනස්කම් හිතකර බවට පත් කර ගැනීමට කළ හැකි කාර්යයන් පිළිබඳ සාකච්ඡා කිරීම හා ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
- ස්වභාවික පරිසරයේ (සුළඟ, වැස්ස, ඉඩෝරය වැනි) සිදුවන වෙනස්කම් පිළිබඳ අත්දැකීම් සාකච්ඡා කිරීම. එවැනි අවස්ථාවලට ලක් වූ ස්ථාන තිබේ නම් නිරීක්ෂණය හා වාර්තා කිරීම.
- පරිසරයේ සිදුවන වෙනස්කම් රංගන, වාදන, ගායන හා නාට්‍ය ඇසුරින් ඉදිරිපත් කිරීම.
- පරිසරයේ සිදු වූ වෙනස්කම් දැක්වෙන අවස්ථාවක් චිත්‍රයට නැඟීම.

## තේමාව :- 10.0 කැමති - අකමැති

**නිපුණතා :-**

- පාසලේ දී මුහුණ දීමට සිදුවන සිදුවීම්වලින් තමා කැමති හා අකමැති අවස්ථා පිළිබඳ අත්දැකීම් අන් අය සමඟ හුවමාරු කර ගනියි.
- පාසලේ දී සිදුවන අකමැති සිදුවීම්වලට හේතු සොයා බලා ඒවා කැමති සිදුවීම් බවට පත් කර ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කරයි.
- ආසන්න පරිසරයේ ඇති අනතුරුදායක හා අවදානම් සහිත ස්ථාන හා අවස්ථා සොයා බලා ආරක්ෂාවීමට පියවර ගනියි.
- වැඩිදෙනකුගේ කැමැත්ත ඇති ව තෝරා ගත් ක්‍රීඩාවක්, ගායනයක්, රංගනයක් කිරීමට ඉදිරිපත් වෙයි.
- තම අභිමතය පරිදි තෝරා ගන්නා ලද නිර්මාණයක් තුළින් තම හැකියා ප්‍රදර්ශනය කරයි.

අන්තර්ගතය :-

- වටපිටාවේ එදිනෙදා සිදුවන සිද්ධි ඇසුරින් තමන් කැමති සිදුවීම් හා අකමැති සිදුවීම්
- අකමැති සිදුවීම්වලට අනුමාන හේතු හා වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග
- පරිසරයේ සතුන් හා ගහකොළ සම්බන්ධ ව සිදුවන තමන් කැමති හා අකමැති සිදුවීම්
- එම අකමැති සිදුවීම් කැමති සිදුවීම් බවට පත් කිරීමට කළ හැකි දේ
- විවිධ ජන කොට්ඨාස හා බැඳුණු සමහර පුරුදු හා හැසිරීම් පිළිබඳ සංවේදී බව
- සිසුන් කැමති එළිමහන් ක්‍රීඩා, ගායනා, රංගන, නිර්මාණ
- සිත්ගත් චරිත අනුකරණ

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

පාසල තුළ සිදුවන කැමති අකමැති සිද්ධි පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම. රංගන මගින් ද ප්‍රකාශ කිරීම.
හඳුනා ගන්නා සිද්ධි කැමති හෝ අකමැති වීමට හේතු සාකච්ඡා කිරීම.
පරිසරයේ ඇති ගහකොළ හා සතුන් සම්බන්ධයෙන් සිදුවන කැමති හා අකමැති සිදුවීම් පිළිබඳ සොයා බැලීම. ඒ පිළිබඳ අත්දැකීම් හා රැස් කර ගත් තොරතුරු පිළිබඳ සාකච්ඡා කිරීම.
ගහකොළ මෙන් ම සතුන්ගෙන් සිදුවිය හැකි අනතුරු පිළිබඳ අත්දැකීම් කතා බහ කිරීම හා ඒවායින් වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම.
තමන් කැමති ක්‍රීඩා, නිර්මාණ, ගායන හා රංගනවල යෙදීම.

තේමාව :- 11.0 අපට ඕනෑ දේ ලැබෙන හැටි

**නිපුණතා :-**

ඉගෙනුම් කටයුතුවල සාර්ථකව නියැළීම සඳහා පාසල් පරිසරයෙන් හා නිවසින් අවශ්‍ය උදව් ලබා ගනියි.
සිය ඉගෙනුම් කටයුතුවලට පාසලින් හා නිවසින් උදව් දෙන අය අගය කරයි.
භාණ්ඩ හා උපකරණ ක්‍රමවත්ව පවිත්‍රව හා ආරක්ෂාකාරීව භාවිත කරයි.
පාසලේ පොදු වස්තු හා පොදු දේපළ ආරක්ෂා කිරීමට දායක වෙයි.
විවිධ කාර්යයන් සඳහා උදව් වන පුද්ගලයින් හා උපකරණවල ලක්ෂණ සුවිශේෂී කර ගනිමින් සෞන්දර්යාත්මක
ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් පරිහරණය කළ හැකි භාණ්ඩ හා උපකරණවල ආකෘති නිර්මාණය කරයි.

**අන්තර්ගතය :-**

- සිය ඉගෙනුම් අවශ්‍යතා සපයන ස්ථානයක් වශයෙන් පාසල හා නිවස
- සිය ඉගෙනුම් වැඩට අවශ්‍ය දේවල් අතරින් පාසලින් සැපයෙන දේවල් (පුද්ගලයින්, බඩු බාහිරාදිය හා ඉඩකඩ) භාණ්ඩ හා උපකරණ පිරිසිදු ව හා ආරක්ෂාකාරී ව පරිහරණය කර ගන්නා ආකාරය
- පාසලින් සැපයෙන ඉගෙනුම් පහසුකම්
- සිය ඉගෙනුම් වැඩට ගෙදරින් සපයා දෙන උදව්
- පාසලේ පොදු වස්තූන්ට ආරෝපිත කතා හි චිත්‍ර නිර්මාණය
- භාණ්ඩ හා උපකරණවලින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ගායන හා රංගන
- විවිධ ද්‍රව්‍ය භාවිත කරමින් පාසලේ දී පරිහරණය කරන භාණ්ඩ හා උපකරණවල ආකෘති නිර්මාණය

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

ඉගෙනුම් කටයුතුවලට පාසලෙන් හා පාසල් පරිසරයෙන් නිවසින් ලැබෙන උදව් පිළිබඳ සාකච්ඡා කිරීම හා අගය කිරීම.
පන්ති කාමරය තුළ බඩු බාහිරාදිය ක්‍රමවත්ව පවිත්‍රව හා ආරක්ෂා කිරීමේ හුරුකම් ලබා ගැනීම.
පන්ති කාමරවල භාවිත කරන උපකරණවල ආකෘති කිහිපයක් සකස් කිරීම.
භාණ්ඩ හා උපකරණවල ක්‍රියාකාරිත්වය මතුවන කවි ගීත ගායන හා රංගනවල නිරත වීම.
පාසලේ පොදු දේපළ ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ සාකච්ඡා කිරීම හා පොදු වස්තු ආරක්ෂා කිරීමට දායක වීමේ වැදගත්කම මතු කිරීම. පාසලේ පොදු ස්ථාන නිරීක්ෂණය කරමින් හානි සිදුවී තිබේ ද යන්න සොයා බැලීම. ඒවා නිසි පරිදි පවත්වා ගැනීමට කළ හැකි යෝජනා ඉදිරිපත් කිරීම.
පාසල් වත්ත නිරීක්ෂණ ඇසුරින් තමන් සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැගීම හා කිසියම් පොදු වස්තුවකට ආරෝපිතව කතා කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තේමාව :- 12.0 ගමන් බිමන්

**නිපුණතා :-**

නිවැරදි ඉරියව් අනුගමනය කරමින් ඇවිදියි.
ඇවිදීම, වාඩිවීම සහ බරක් එසවීම වැනි කාර්යන්හි දී සමබරතාවය රැක ගනියි.
බාධාකාරී සහ දුෂ්කරතාවන්ගෙන් ආරක්ෂා වෙමින් ගමන් කරයි.
සමබරතාවය රැක ගනිමින් නිවැරදි ඉරිව්වලට අනුව ක්‍රීඩාවන්හි නිරත වෙයි.
ශරීරයේ සමබරතාවය රැකෙන විවිධ ඉරියව් නිරූපණය කරයි.

**අන්තර්ගතය :-**

සිය නිවසේ අය හා නිවසට පැමිණෙන අයගේ ගමන් බිමන් පිළිබඳ ව තොරතුරු
නිවැරදි ඉරියව් අනුගමනය කරමින් ඇවිදීම
පාරේ ගමන් කරන විට ආරක්ෂාකාරී බව
සමබර ව ඇවිදීම
බහුල ව භාවිත වන වාහනවල ආකෘති

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

නිවැරදි ඉරියව් අනුගමනය කරමින් ඇවිදීමේ නිවැරදි ක්‍රමය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම.
සෙල්ලම් මිදුල ප්‍රයෝජනයට ගනිමින් සමබරව ඇවිදීමේ ක්‍රියාකාරකම්වල නිරත වීම.
පාරේ ගමන් කරන විට පිළිපැදිය යුතු නිවැරදි ක්‍රම හා ආරක්ෂාකාරීව ගමන් කළ යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම හා අදාළ ක්‍රියාකාරකම්වල නිරත වීම.
බරක් එසවීම, ඉඳ ගැනීම හා ඇවිදීම වැනි ඉරියව් ආදර්ශනය කිරීම හා ගායනය සහිත භූමිකා රංගනවල යෙදීම.

තේමාව :- 13.0 එළිය සමඟ සෙල්ලම්

නිපුණතා :-

ස්වභාවික ව එළිය අඩුවැඩි වීම හා ඒ අනුව පරිසරයේ සිදුවන වෙනස්කම් ගවේෂණය කරයි.
එළිය විහිදීම අඩු කිරීමේ, වැඩි කිරීම් සහ එහි දිශාව වෙනස් කළ හැකි අයුරු අත්හදහා බලයි.
එළියේ වෙනස්වීම අනුව සෙවනැලිවල දිග වෙනස්වීම් නිරීක්ෂණය කරමින් ඒ ආශ්‍රිත ක්‍රීඩාවල යෙදෙයි.
එළිය විහිදීම අඩු වැඩි වන සහ එළියේ විවිධ වර්ණ මතු වන නිර්මාණ ගොඩනගයි.
එළිය අඩු වැඩි වන අවස්ථාවල පරිසරයේ සිදුවන වෙනස්කම් ආශ්‍රිත කවි ගී ගායන රංගනවල යෙදෙයි.

**අන්තර්ගතය :-**

ස්වාභාවිකව පරිසරයේ එළිය අඩු, වැඩි වන අවස්ථා
එළිය අඩු වීම සමඟ පරිසරයේ සිදුවන වෙනස්කම්
යම් ස්ථානයකට ලැබෙන හිරු එළිය අඩු කිරීමේ සහ වැඩි කිරීමේ සරල ක්‍රම
එළිය ගමන් කරන දිශාව වෙනස් කළ හැකි ක්‍රම

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

ස්වභාවික එළිය අඩු වැඩිවන අවස්ථා පිළිබඳ අත්දැකීම් ප්‍රකාශ කිරීම.
එළිය අඩු වැඩිවීමත් සමග පරිසරයේ සිදුවන වෙනස්කම් (ශාක හා සතුන්) පිළිබඳ ව නිරීක්ෂණය කිරීම • හා අත්දැකීම් ප්‍රකාශ කිරීම. විවිධ අයුරින් වාර්තා කිරීම.
සෙවනැලි ආශ්‍රිත ක්‍රීඩා කිහිපයක නිරත වීම.
එළිය විහිදීම අඩු වැඩි කිරීමේ හා එළිය ගමන් කරන දිශාව වෙනස් කිරීමේ ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.
වර්ණ යොදා ගනිමින් නිර්මාණ කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

තේමාව :- 14.0 මිනිසුන් වැඩ කරන තැන්

**නිපුණතා :-**

ආසන්න පරිසරයේ පුද්ගලයින් ජීවිකාව සඳහා වැඩ කරන ස්ථාන හා ඒ අශ්‍රිත තොරතුරු ගවේෂණය කරයි.

තාක්ෂණික වෙනස්වීම් අනුව වැඩ කරන අයුරු වෙනස් වී ඇති ආකාරය විමර්ශනය කරයි.

වැඩබිම්වල විවිධ අවස්ථා නිරූපණය කරන භූමිකා රංගන ගැයෙන කවි ගී ... වැනි සෞන්දර්යාත්මක අංගවල

යෙදෙමින් වින්දනයක් ලබයි.

ජීවිකාව සඳහා කරන විවිධ වැඩවලින් සිදුවන සේවය අගය කරයි.

විවිධ වැඩබිම්වල භාවිත කරන මෙවලම් හා උපකරණවල ආකෘති නිර්මාණය කර ඒවා ඇසුරු කර ගනිමින් ජන

ක්‍රීඩාවල යෙදෙයි.

**අන්තර්ගතය :-**

ගමේ හා ගමෙන් පිට ප්‍රදේශවල මිනිසුන් වැඩ කරන විවිධ තැන්

ගමේ වැඩිදෙනකු කරන වැඩ හා සම්බන්ධ තොරතුරු

වැඩපලවල දී වැඩට බාධා කෙරෙන මිනිස් හැසිරීම් හා වෙනත් කරුණු

කලින් කලට වැඩ කිරීමේ ක්‍රමවල සිදු වී ඇති වෙනස්කම් පිළිබඳ ව විමසිලිමත් බව

විවිධ වැඩ කටයුතු හා සම්බන්ධ අතීතයේ සිට භාවිත වන කවි, ගී හා නැටුම්

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

තම පාසලට ආසන්න ප්‍රදේශයේ වැඩ බිමක් නිරීක්ෂණය කිරීම. (වැඩ බිමේ විවිධ අවස්ථා,පැරණි ක්‍රම, නව ක්‍රම, ඇඳුම් පැළඳුම්) නිරීක්ෂණ පිළිබඳ අත්දැකීම් කතා බහ කිරීම.

වැඩ බිමක අවස්ථා දැක්වෙන භූමිකා රංගනවල නිරත වීම.

තමන් දුටු හෝ අවස්ථාවට ගැළපෙන හෝ අසා ඇති වැඩ බිම් හා සම්බන්ධ ජන ගී, කවි, ගීත ගායනය හා රංගනය.

තමන් සිත් ගත් අවස්ථා චිත්‍රයට නැඟීම.

නිරීක්ෂණය කළ වැඩ බිමේ භාවිත කළ උපකරණ හෝ තමන් කළ වැඩ බිමක භාවිත කළ උපකරණ නිර්මාණය හා ඒවා භාවිත කරමින් රංගනයෙහි යෙදීම.

තේමාව :- 15.0 වටපිටාවේ වෙනස් තැන්

**නිපුණතා :-**

තම ප්‍රයෝජනය පිණිස මිනිසා විසින් පරිසරයේ කර ඇති වෙනස්කම් විමර්ශනය කරයි.

මිනිසාට ජීවත් වීම සඳහා මූලික වශයෙන් ආහාර නිපදවන ස්ථාන හඳුනා ගනියි.

පස රැක ගැනීමේ විවිධ උපායමාර්ග අත්හදා බලයි.

පරිසර විවිධත්වය තමන් කැමති මාධ්‍යයක් භාවිත කරමින් නිර්මාණය කරයි.

ශාරීරික වර්ධනයට අදාළ මිනිසා විසින් සකස් කර ගත් ස්ථානයක් ලෙස සෙල්ලම් මිදුල හඳුනාගෙන ශරීර වර්ධනයට අදාළ ක්‍රියාකාරකම් කිහිපයක නියුක්ත වෙයි.

වටපිටාවේ සුන්දරත්වය අගයමින් කවි ගී ගායනා හා රංගනවල නිරත වෙයි.

**අන්තර්ගතය :-**

ගොවිපල/කුඹුර මිනිසා විසින් සකස් කරන ලද පරිසරයක් ලෙස

වගාව පවත්වා ගැනීමට, පස රැක ගැනීමට ගෙන ඇති උපාය මාර්ග

පරිසර විවිධත්වය විවිධ මාධ්‍ය භාවිත නිර්මාණ ගායන හා රංගන ඇසුරින් ඉදිරිපත් කිරීම

විවිධ කාර්යයන් සඳහා භූමිය යොදා ගෙන ඇති අයුරු හා සුදුසු ස්ථානයක් තෝරා ගනිමින් කෙරෙන ක්‍රීඩා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

පාසල් වත්තේ හෝ ආසන්න පරිසරයේ හෝ මිනිසා විසින් සකස් කර ඇති වගා බිමක් නිරීක්ෂණය කිරීම.
රැස් කරන තොරතුරු රූප සටහන් හෝ චිත්‍ර, ආකෘති හෝ භූමිකා රංගන මගින් ඉදිරිපත් කිරීම.
පස ආරක්ෂා කර ගැනීමේ ක්‍රම පිළිබඳ සාකච්ඡා කිරීම හා ඊට දායක විය හැකි ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීම.
පරිසර විවිධත්වය ගළපා ගනිමින් ශාරීරික ව්‍යායාම සඳහා ක්‍රීඩාවල නිරත වීම.
විවිධ මාධ්‍ය භාවිත කරමින් පරිසර විවිධත්වය දැක්වෙන නිර්මාණ ඉදිරිපත් කිරීම.

තේමාව :- 16.0 අපේ උදවු ඕනෑ අය

**නිපුණතා :-**

උදව් අවශ්‍ය අය සඳහා උදව් කිරීමට තම කැමැත්තෙන් ඉදිරිපත් වෙයි.
උදව් කළ අවස්ථා හා සිද්ධි පිළිබඳ අත්දැකීම් අන් අය සමඟ හුවමාරු කර ගනියි.
එදිනෙදා ජීවිත කාර්යයන්වල දී සැම කෙනෙකුගේ ම උදව් අවශ්‍ය වන බව හා අවශ්‍ය අවස්ථාවල කෙනෙකුට උදව් දීම තම යුතුකමක් සේ පිළිගනිමින් ක්‍රියා කරයි.
සාමූහික ව වැඩ කිරීමෙන් වැඩි ඵලයක් ලබා ගැනීමට හැකියාවක් ලැබෙන බව අවබෝධ කර ගනියි.
කෙනෙකුගේ සහාය ලබා ගනිමින් ක්‍රියාත්මක වන ක්‍රීඩාවල නිරත වෙයි.

**අන්තර්ගතය :-**

පාසල් වටපිටාවේ/ගමේ හමුවන උදව් ඕනෑ කරන අය
පන්තියේ එකිනෙකාට උදව් කෙරෙන ආකාර
උදව් කිරීම හා සම්බන්ධ සිද්ධි හා අත්දැකීම්
කෙනෙකුගේ උදව්වක අවශ්‍යතාව හඳුනා ගැනීමේ හැකියාව වර්ධනය
සැම අයෙකුට ම අන්‍යයන්ගේ උදව් අවශ්‍ය වන බව
සාමූහික ව වැඩ කිරීමෙහි අගය දැක්වෙන ගී / කවි ගායනය

**ක්‍රමවේදය හා ක්‍රියාකාරකම් :-**

උදව් ඕනෑ අය කවුද යන්න සාකච්ඡා මගින් දැනුවත් වීම.
පන්ති කාමරයේ හෝ පාසලේ දී එකිනෙකා උදව් කර ගන්නා ආකාරය කෙසේ ද යන්න සාකච්ඡා කිරීම.
අන්‍යෝන්‍ය උදව් ලබා ගන්නා ආකාරය නිරූපණය වන අවස්ථා ඉදිරිපත් කිරීම. උදව් කිරීම හොඳ පුරුද්දක් ලෙස අගය කිරීම.
උදව් කිරීම හා සම්බන්ධ සිද්ධි හා අත්දැකීම් කැමති අයුරින් ඉදිරිපත් කිරීම.
උදව් කළ යුතු අයට උදව් කිරීමේ අවස්ථාවක් ප්‍රායෝගික ව ඉටු කිරීම.
සතුන් පිළිබඳ කියැවෙන කවි ගී තාලානුකූල ව ගායනා කරයි. රංගනයේ යෙදෙයි කතන්දර ඉදිරිපත් කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.